**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**රුපියල් මිලියන 160,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව**

2023 දෙසැම්බර් මස 12 වැනි දින 11.50%2026'A' කාණ්ඩය යටතේ රුපියල් මිලියන 50,000 ක, 11.50%2028'B' කාණ්ඩය යටතේ රුපියල් මිලියන 80,000 ක සහ 11.25%2031'A' කාණ්ඩය යටතේ රුපියල් මිලියන 30,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කෙරේ. මෙම නිකුතුවට අදාල විස්තර පහත දැක්වේ.

| කාණ්ඩය | **11.50%2026'A'** | **11.50%2028'B'** | **11.25%2031'A'** |
|---|---|---|---|
| සු.හ.ජා. අංකය (ISIN)* | LKB01026H014 | LKB00528L152 | LKB01231C151 |
| වෙන්දේසියට ඉදිරිපත් කරන ප්‍රමාණය | රුපියල් මිලියන 50,000 | රුපියල් මිලියන 80,000 | රුපියල් මිලියන 30,000 |
| පොලී අනුපාතිකය | වර්ෂයකට සියයට 11.50 | වර්ෂයකට සියයට 11.50 | වර්ෂයකට සියයට 11.25 |
| නිකුතුවේ දිනය | 2016 අගෝස්තු 01 වැනි දින | 2023 දෙසැම්බර් 15 වැනි දින | 2019 මාර්තු 15 වැනි දින |
| **කල් පිරෙන දිනය** | **2026 අගෝස්තු 01 වැනි දින** | **2028 දෙසැම්බර් 15 වැනි දින** | **2031 මාර්තු 15 වැනි දින** |
| පොලී ගෙවන දිනයන් | පෙබරවාරි 01 සහ අගෝස්තු 01 වැනි දින | ජුනි 15 සහ දෙසැම්බර් 15 වැනි දින | මාර්තු 15 සහ සැප්තැම්බර් 15 වැනි දින |
| උපචිත පොලිය | රුපියල් 100 ක් සඳහා රු. 4.2500 | රුපියල් 100 ක් සඳහා රු. 0.0000 | රුපියල් 100 ක් සඳහා රු. 2.8125 |
| වෙන්දේසි කරන දිනය | 2023 දෙසැම්බර් මස 12 වැනි අඟහරුවාදා දින | | |
| ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | 2023 දෙසැම්බර් මස 12 වැනි අඟහරුවාදා පෙ.ව. 11.00 ට | | |
| **ගෙවීම් කළ යුතු දිනය** | **2023 දෙසැම්බර් මස 15 වැනි දින** | | |
| ටෙන්ඩර් සඳහා අවම මුදල | රුපියල් මිලියන පහක් (5,000,000) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000) ගුණිතයන්ගෙනි | | |

ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. පොලිය ගෙවූ අවසාන දිනයේ සිට පියවීම කරනු ලබන දිනට උපචිත පොලිය රහිත මිල පදනම් කර බැඳුම්කර සඳහා ලංසු කැඳවනු ලැබේ. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 2206297 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී | 2639883 |
| ලංකා බැංකුව | 2541938 | මහජන බැංකුව | 2206783 |
| කැපිටල් එලයන්ස් පී.එල්.සී | 2317777 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2305842 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2332319 | සෙලාන් බැන්ක් පී.එල්.සී | 2456340 |
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2425010 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | 2675096 |

වෙළෙඳපොල තත්ත්වයන් මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් කාණ්ඩය යටතේ වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණයට නොවැඩි ඕනෑම ප්‍රමාණයක් පිළිගනු ලැබිය හැකිය.

අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතීයික වෙළෙඳපොළෙන්ද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30 ,ජනාධිපති මාවත
කොළඹ 01
දුරකථන:ෆැක්ස් 2477011 :2477687
http://www.cbsl.gov.lk

එන්. ඩී. වයි. සී. වීරසිංහ
රාජ්‍ය ණය අධිකාරී/ලේඛකාධිකාරී